# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1818/20 - 2013 ජූලි මස 11 වැනි බ්‍රහස්පතින්දා - 2013.07.11

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී.)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**පඩිපාලක සභා ආඥාපනත**

නිවේදනයයි

**වී කෙටීමේ කර්මාන්තය පිළිබඳ පඩිපාලක සභාව**

136 වැනි අධිකාරය වන පඩිපාලක සභා ආඥාපනතේ 30 වැනි වගන්තියෙන් තමන් වෙත පැවරී ඇති බලතල ප්‍රකාර මෙහි වූ උපලේඛනයේ නිශ්චිතව සඳහන් ස්වකීය තීරණයන් එහි දක්වා ඇති පරිද්දෙන් වෙනස් කිරීමට වී කෙටීමේ කර්මාන්තය පිළිබඳ පඩිපාලක සභාව යෝජනා කරන බව එකී පඩිපාලක සභා ආඥාපනතේ 28 වන වගන්තියේ විධිවිධාන අනුව මෙයින් නිවේදනය කරනු ලැබේ.

ඉහත කී යෝජනාවට දැක්වෙන විරෝධතාවයන් 2013 අගෝස්තු මස 01 දින දහවල් 12.00 දක්වා එම පඩිපාලක සභාවේ සභාපති විසින් භාරගනු ලැබේ.

ඉදිරිපත් කරන සෑම විරෝධතාවයක්ම ලියවිල්ලකින් විය යුතු අතර එම විරෝධතාවය දැක්වීමට හේතු වූ කරුණු පිළිබඳ ප්‍රකාශයක්ද ඊට අඩංගු විය යුතුය.

වී. බී. පී. කේ. වීරසිංහ,<br>
සභාපති,<br>
වී කෙටීමේ කර්මාන්තය පිළිබඳ පඩිපාලක සභාව.

2013 ජූලි මස 03 දින,<br>
කොළඹ 05,<br>
කම්කරු දෙපාර්තමේන්තුවේ දී ය.

**උපලේඛනය**

වී කෙටීමේ කර්මාන්තය පිළිබඳ පඩිපාලක සභාව විසින් ඇති කරන ලදුව, 1971 මාර්තු මස 19 වැනි දින අංක 14950 දරන *ගැසට් පත්‍රයේ* පළ කරනු ලැබුවා වූ නිවේදනයෙහි වූ උපලේඛනයෙහි සවිස්තරව දක්වා ඇත්තා වූද, කලින් කල වෙනස් කරන ලද්දා වූද අවසන් වරට 2010 ජුනි මස 30 දින අංක 1660/35 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද නිවේදනය මගින් වෙනස් කරනු ලැබූ තීරණ එම උපලේඛනයෙහි II වන කොටස වෙනුවට පහත සඳහන් කොටස ආදේශ කිරීමෙන් තව දුරටත් වෙනස් කළ යුතුය.

*II වන කොටස*

**වේතන**

කාල මිම්මේ වැඩවලට අදාළ අවම වේතන අනුව දිනකට කම්කරුවෙකුට රු. 750.00ක් ගෙවිය යුතුය.

07 - 743


ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

1 A – G 017939 — 320 (2013/07)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*